පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03

උපදෙස් ෑ අංක 01 සිට 40 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පහත කවි/සංවාද ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A. දී කිරි දී කිරි - ගෙනාවා දී කිරි
මිහිපිට කාටත් - ගුණ දෙන දී කිරි

B. නාගසේන ස්ථවිර - රථ චක්‍රය, පඤ්ජරය, රථ දණ්ඩ විය, රැන කෙවිට යන මේ සියල්ල ම රථය ද?

C. භික්ෂුව - අමිත, තෙජොබල වික්‍රම ප්‍රාතාපාලං කෘත කමලා සනෙන්ද්‍රාදී දෙවියොත් අවුද?

D. බෙල්ල වට ඉසුණු ගෝමර පෙති වැටුණා
ලොල්ල වඩන පියයුරු කඳුළින් තෙමුණා
ලොල්ල ඇතිව බිසවට නපුර පැමිණුනා
කෙල්ල හඬයි හිස උකුළේ තබාගෙන

E. අත්තක පිපි මලක් ලෙසේ
මගේ පුතා මටත් උසේ
දොයි දොයි දොයි දොයිය බබා

01. දොරකඩ අස්න බෞද්ධ පූජා කර්මයට අයත් වනුයේ,
1) A 2) B 3) C 4) D

02. ලූෂන් බුලත්සිංහල මහතාගේ නාට්‍ය නිර්මාණයකට අයත් වන්නේ,
1) D 2) A 3) C 4) E

03. සුනියම් යාගයට අයත් ගීතයක් වනුයේ,
1) D 2) C 3) B 4) A

04. මිලින්ද ප්‍රශ්නය හා සම්බන්ධ සංවාද ඛණ්ඩයක් දැක්වෙන්නේ,
1) C 2) E 3) A 4) B

05. සන්නි යකුම ශාන්තිකර්මය හා සම්බන්ධ කවියක් දැක්වෙන්නේ,
1) D 2) E 3) A 4) C

- නිවැරදි පිළිතුර තෝරන්න.

06. කතන්දරයක් හා නාට්‍යයක් අතර වෙනසක් වන්නේ,
1) අපූර්ව කතා වස්තුවකින් යුක්ත වීම.
2) චරිත හා සංවාද දක්නට ලැබීම.
3) මුල, මැද, අග අනුපිළිවෙලින් ගැලපීම.
4) ගැටුම් අවස්ථා සහිත වීම.

07. ප්‍රොසීනියම් වේදිකාවක දක්නට ලැබෙන තිර වර්ගයකි.
1) අහස් තිරය
2) බිම් තිරය
3) තීරු පටි තිරය
4) වියන් තිරය

08. අංගරචනා ශිල්පියා හා සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගත යුතු ශිල්පියා වන්නේ,

1) වේදිකා පරිපාලක
2) සංගීත ශිල්පියා
3) පෙළ මතක් කරන්නා
4) රංගාලෝක ශිල්පියා

09. ලෝකධර්මී ශෛලියේ නාට්‍යයක ලක්ෂණයක් ලෙස සැලකෙන්නේ,

1) පසුතල නොමැතිව නාට්‍ය රඟ දැක්වීමයි.
2) ස්වභාවික ජීවිතයට ආසන්න ලෙස සතර අභිනය හැසිරවීමයි.
3) යථාර්ථය ඒ ආකාරයෙන් ම වේදිකාවේ පෙන්වීමයි.
4) අතිශයෝක්තියෙන් යුතුව ඉදිරිපත් කෙරෙන රංගනයකි.

10. ක්ෂණික නිරූපණය මගින් නළුවාට ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,

1) මානසික හා ශාරීරික සැහැල්ලු බව.
2) නායකත්වයට හුරු වීම.
3) පරිකල්පන හැකියාව වර්ධනය වීම.
4) ශරීරය උණුසුම් වීම.

පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 11 -15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල් කෘතිය | මුල් රචකයා | මෙරට නිෂ්පාදිත නාට්‍ය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| චරන්දාස් චෝර් | හබීබ් තන්විර් | A | පරාක්‍රම නිරිඇල්ල |
| කෘමි නාටක | කැරල් චැපෙක් සහෝදරයෝ | බිහි වූ බෝසතාණෙනි | B |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්ස් සුවාන්ස් | C | හිත හොඳ අම්මණ්ඩි | සුගතපාල ද සිල්වා |
| D | එව්ගිනි ෂ්වාත්ස් | මකර රාක්ෂ | පරාක්‍රම නිරිඇල්ල |
| සොයා යන චරිත හයක් | E | හරිම බඩු හයක් | සුගතපාල ද සිල්වා |

11. ‘A’ කොටුවට අයත් විය යුතු නාට්‍ය වනුයේ,

1) විනිශ්චය
2) සෙක්කුව
3) උත්තමාවී
4) චරන්දාස්

12. ‘B’ කොටුවට අයත් මෙරට නිෂ්පාදක වන්නේ,

1) දයානන්ද ගුණවර්ධන
2) බන්ධුල ජයවර්ධන
3) හෙන්රි ජයසේන
4) ජයලත් මනෝරත්න

13. ‘C’ කොටුවට අයත් විය යුතු මුල් රචකයා වන්නේ,

1) බර්ටෝල් බ්‍රෙෂ්ට්
2) ශේක්ෂ්පියර්
3) සැමුවෙල් බෙකට්
4) බර්නාඩ් ෂෝ

14. ‘D’ කොටුවට අයත් විය යුතු මුල් කෘතිය නම්,

1) ද ජස්ට්
2) ද හෝස්
3) ද ඩ්‍රැගන්
4) ද රයිවල්ස්

15. ඉහත වගුවේ ‘E’ කොටුවට අයත් විය යුත්තේ,

1) එව්ගිනි ෂ්වාත්ස්
2) ලුයිජි පිරැන්ඩෙලෝ
3) බර්ටෝල් බ්‍රෙෂ්ට්
4) ටෙනසි විලියම්ස්

16. නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත පැමිණවීමේ දී භාවිත කරනු ලබන මාධ්‍ය,

1) අභිනය
2) අනුකරණය
3) ආනුෂංගික කලා
4) සමාරෝපය

17. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ ඇතුලත් ප්‍රධාන නාට්‍ය ප්‍රභේද වනුයේ,

1) නාට්‍යධර්මී හා මිශ්‍ර ශෛලිය
2) නාට්‍යධර්මී හා ලෝකධර්මී
3) නාට්‍යධර්මී හා ශෛලිගත
4) තාත්වික හා ස්වභාවික ශෛලිය

18. නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්යයන් වන්නේ,

1) පුහුණුවීමේ සිට වේදිකාගත කිරීම දක්වා සියලු කටයුතු පරිපාලනය කිරීම.
2) නිෂ්පාදකවරයාට මූල්‍ය කටයුතු සඳහා සහාය වීම.
3) නාට්‍යයේ දර්ශනය සඳහා මෙහෙයවීම.
4) නළු නිළියන් රංගනය සඳහා මෙහෙයවීම.

19. මේ අතරින් ආහාර්ය අභිනයට අයත් නොවනුයේ,
1) රංගාලෝකය  2) අංග රචනය  3) නාට්‍ය ගීත  4) පසුතල නිර්මාණ

20. ලෝකයේ පළමු වන නාට්‍ය රඟහල බිහිවූයේ,
1) ලංකාවේ ය.  2) ඉන්දියාවේ ය.  3) ග්‍රීසියේ ය.  4) ජපානයේ ය.

- අංක 21 -25 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිලිතුරු සපයන්න.

A. වේෂ භූෂණ, අංගරචනය, රංගභාණ්ඩ
B. දිව, කන, නාසය
C. නළල, නාසය, කම්මුල්
D. රූපණය, සමාරෝපය, අනුකරණය
E. රංග විධාන, සංවාද, චරිත

21. අංගරචනයේ දී වැදගත් වන කොටස් ඇතුලත් වන්නේ,
1) D  2) B  3) E  4) C

22. 'A' අක්ෂරය සඳහා වඩාත් සුදුසු වන්නේ,
1) ආනුෂංගික අංග  2) සතර අභිනය  3) රූපණය  4) පසුතල නිර්මාණ

23. 'E' අක්ෂරයෙන් දැක්වෙන අංග යොදා ගනු ලබන්නේ,
1) ආනුෂංගික ශිල්පීන්  3) අධ්‍යක්ෂවරයා
2) නාට්‍ය පෙළට  4) ප්‍රේක්ෂකයා

24. 'D' අක්ෂරයේ අංග වඩාත් අවශ්‍ය වන්නේ,
1) ප්‍රේක්ෂකයාට  3) රංගාලෝක ශිල්පියාට
2) අධ්‍යක්ෂවරයාට  4) නළුවාට

25. සංවේදන අභ්‍යාසය සඳහා අවශ්‍ය වන්නේ,
1) A  2) F  3) B  4) D

- පහත ඡායාරූප ඇසුරෙන් අංක 26 -30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A

B

C

D

E

F

26. විකෘති, සඳකිඳුරු, මරාසාද් ආදී නාට්‍යවල රංගන දායකත්වය ලබා දුන්නේ,
1) C  2) F  3) E  4) A

27. අවුරුදු 16 කට වැඩි කාලයක් 'සිංහබාහු' , චරිතයට පණ පොවන ලද්දේ,
1) D  2) C  3) B  4) A

28. මෝදර මෝල, චෙරි උයන ආදී නාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ,
1) E  2) F  3) C  4) D

29. කුවේණි, ජනේලය, අජාසත්ත ආදී නාට්‍ය සඳහා රංගන දායකත්වය ලබා දී ඇත්තේ,
1) D  2) C  3) B  4) A

30. තාරාවෝ ඉගිලෙති, මධුර ජවනිකා ආදී නාට්‍යවල ප්‍රබල රංගන දායකත්වයක් ලබා දුන්නේ,
1) E  2) B  3) A  4) D

31. ශිථිලකරන අභ්‍යාසවල යෙදීමෙන්,
   1) විවිධ ශබ්ද හඳුනාගැනීමට හැකි වේ.
   2) නම් කරන භාවයට අදාල නිරූපණයේ යෙදීමට හැකි වේ.
   3) ශරීරය සීතල වීම සිදු වේ.
   4) ශරීරය සැහැල්ලු වීම සිදු වේ.

32. නාට්‍ය විචාරකයාට ගැලපෙන ගුණාංගය මින් කුමක්ද?
   1) අනුන්ගේ මතයට අවනත වීම.
   2) නාට්‍ය කලාව පිළිබඳ පුළුල් දැනුමක් තිබීම.
   3) පක්ෂපාතී ව කටයුතු කිරීම.
   4) නිහතමානී වීම හා කාරුණික විම.

33. මනමේ නාට්‍ය සඳහා පදනම් වී ඇත්තේ,
   1) ස්වර්ණහංස ජාතකය
   2) කුස ජාතකය
   3) චුල්ල ධනුද්දර ජාතකය
   4) සේරිවාණිජ ජාතකය

34. රංග උපකරණ නිර්මාණ ශිල්පියා අවධානය යොමුකළ යුතු කරුණු වන්නේ,
   1) නාට්‍යයේ ශෛලිය හා භාවිතයේ පහසුව.
   2) නාට්‍යයේ ශෛලිය හා පෙලෙන් කියවෙන යුගය.
   3) චරිතයේ ස්වභාවය හා නළුවාගේ සමෙහි පැහැය.
   4) නාට්‍යයේ සංගීතය හා සංවාදවල ව්‍යක්ත බව.

35. 'කරළිය' නම් රංගභූමිය යොදා ගනු ලබන්නේ,
   1) නූර්තිවල 2) සොකරිවල 3) නාඩගම්වල 4) කෝළම්වල

- පහත තොරතුරු ඇසුරෙන් 36 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. හණ , කෘත්‍රිම කෙඳි විශේෂයකි. කළු, දුඹුරු, සුදු වර්ණවලින් ලබා ගත හැකි ය.
B. චිත්‍රපටි, රූපවාහිනී නාට්‍ය, බැලේ නාට්‍ය, මුද්‍රා නාට්‍ය ආදී කලා අංග දැකිය හැකි ය.
C. වෙස් නැටුම, සවරං, ළි කෙළි වැනි නර්තනාංගවල යෙදේ.
D. රැවුල් ඇලවීමටත්, නෝස් පොටි භාවිතයටත් උපයෝගී කොට ගැනේ.
E. නිර්මිත චලන, තාලානුකුල චලන යෙදීමෙන් රූපණ කාර්යය සාර්ථක කර ගත හැකි ය.

36. ක්‍රේප් හෙයා සඳහා වඩාත් සුදුසු අක්ෂරය නම්,
   1) B 2) D 3) E 4) A

37. D හි සඳහන් අර්ථය නිරූපණය කිරීමට අංගරචන ශිල්පියා යොදා ගනු ලබන්නේ,
   1) ක්‍රේප් හෙයා
   2) ස්ප්‍රිට්ගම්
   3) නෝස්පොටි
   4) ලයිනින් කලර්ස්

38. B හි සඳහන් අර්ථයට වඩාත් සුදුසු වන්නේ, ,
   1) නෘත්‍ය අංග
   2) ප්‍රාසාංගික කලාංග
   3) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය
   4) නෘත්ත අංග

39. නෘත්ත අංග සඳහා යොදා ගනු ලබන්නේ,
   1) C 2) D 3) E 4) B

40. E හි සඳහන් අර්ථයට වඩාත් ගැලපෙන්නේ,
   1) රංග අභ්‍යාස
   2) චලන අභ්‍යාස
   3) නිර්මිත අභ්‍යාස
   4) සංවේදන ආ්‍යාභාස

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) I. දික්තල කාලගෝල නාට්‍ය දෙවනවරට නිෂ්පාදනය වූ වර්ෂය කුමක්ද? (ලකුණු 02)

II. දෙවන නිෂ්පාදනයේ දී දික්තලාගේ චරිතය නිරූපණය කළ නිළිය කවුරුන්ද? (ලකුණු 02)

III. මෙම නාට්‍යයේ දී භාවිතා කරන සංගීත භාණ්ඩ 2ක් නම් කරන්න. (ලකුණු 02)

IV. නාට්‍ය පිටපතේ ඇති රංගවිධාන වැදගත් වන පාර්ශව දෙකක් ලියන්න. (ලකුණු 02)

V. මෙම නාට්‍යයේ රංග භාණ්ඩයක් ලෙස භාවිතා කරන්නේ කුමක්ද? (ලකුණු 02)

VI. දික්පිටියාගේ තනිකම පිළිබඳ හැඟවෙන ගී පදයේ පද 2ක් ලියා දක්වන්න. (ලකුණු 02)

(02) I. නාට්‍ය පෙළක් යනු කුමක්ද? (ලකුණු 02)
II. නාට්‍ය පෙළක දක්නට ලැබෙන අංග 4ක් ලියන්න? (ලකුණු 04)
III. නාට්‍ය කලාව හා චිත්‍රපටි කලාව අතර අසමාන ලක්ෂණ 6ක් ලියන්න. (ලකුණු 06)

(03) I. රංගභූමිය බෙදෙන ප්‍රධාන කොටස් කීයද? ඒ මොනවාද? (ලකුණු 02)
II. රංගභූමියක තිබිය යුතු මූලික ලක්ෂණ 4ක් ලියන්න. (ලකුණු 04)
III. නූතන රංගභූමිය ඇද නම් කර එය නළුවාට හා ආනුෂංගික ශිල්පීන්ට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) I. කාන්තාවන්ට පමණක් සුවිශේෂී ව පවත්වනු ලබන ශාන්තිකර්මය හා සම්ප්‍රදාය කුමක්ද? (ලකුණු 02)
II. එම ශාන්තිකර්මයේ දැක්වෙන අන්තර් රංග අවස්ථා 03ක් නම් කරන්න. (ලකුණු 04)
III. ඔබ II කොටසෙහි නම් කරන ලද අවස්ථා එකක් තෝරා ගෙන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

(05) I. රූපණය යන්න හඳුන්වන්න. (ලකුණු 02)
II. රූපණ ශිල්පියෙකු සතු ගුණාංග 4ක් ලියන්න. (ලකුණු 04)
III. ඔබ රූපණ ශිල්පියෙකු ලෙස නාට්‍යයකට සම්බන්ධ වන්නේ නම් එහිදී ක්‍රියාකරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) I. ''දෙයක් වේ නම් සුදුස්සාටම අයිති විය යුතු'' යන්න තේමාව යොදා ගෙන නිෂ්පාදනය වූ නාට්‍ය හා එහි අධ්‍යක්ෂවරයා කවුද?

(ලකුණු 02)

II. මෙම අධ්‍යක්ෂවරයාගේ පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය දෙක බැගින් ලියන්න. (ලකුණු 04)
III. ඔහුගෙන් නාට්‍යකලාවට සිදු වූ සේවය අගයමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) පහත කතා සාරාංශය ඔබ කැමති අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

කසුනි නාට්‍ය හා රංගකලාව හදාරන උසස් පෙළ ශිෂ්‍යාවකි. රංගනයට මෙන් ම ගායනයට දක්ෂතා දක්වන සිසුවියකි. දිනක් පාසලේ උත්සවයකට රංගනයක් ඉදිරිපත් කරන අතරතුර ඇය සිහිසුන්ව ඇද වැටුණි. එතැන් සිට ............................

I. පසුබිම, කාලය, චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ රචනා කිරීම. (ලකුණු 04)
II. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04)
III. නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම. (ලකුණු 04)